## <u>2022 දෙසැම්බර් මස16 වන දින පැවති</u>

## <u>පනස් හයවන මහ සභා රැස්වීමේ කෙටුම්පත් වාර්තාව</u>

**දිනය :-2022.12.16**

**ස්ථානය :- නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව**

**වේලාව :- පෙ.ව 10.00**

**සහභාගී වූ :-**

| | | | |
|---|---|---|---|
| **01.** | ගරු සභාපති | එස්.බී කුමාරදාස මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **02.** | ගරු උප සභාපති | එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **03.** | ගරු මන්ත්‍රී | බී.ඒ.ජී.එම්.කේ.ජී.ජී කුමාරි මැතිනිය | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **04.** | ගරු මන්ත්‍රී | කේ.ඒ ශාන්ත මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **05.** | ගරු මන්ත්‍රී | ජේ.ඒ.ඩී විමලසිරි මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **06.** | ගරු මන්ත්‍රී | පී.ටී සිරිසේන මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **07.** | ගරු මන්ත්‍රී | බී.බී.ඊ ගයාන් චාමර මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **08.** | ගරු මන්ත්‍රී | එච්.ඩබ්.ජී.එන් කුමුදු වසන්ති මැතිනිය | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **09.** | ගරු මන්ත්‍රී | කේ.ඒ සංජීව මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **10.** | ගරු මන්ත්‍රී | ජේ.ඒ ජයවර්ධන මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **11.** | ගරු මන්ත්‍රී | පී.එස්.බී සිරිවර්ධන මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **12.** | ගරු මන්ත්‍රී | ඩී.පී බන්දුලසේන මැතිතුමා | ( ශ්‍රී.ල නි.ප) |
| **13.** | ගරු මන්ත්‍රී | එස්.ඒ.කේ.පී ගුණවර්ධන මැතිතුමා | ( ජ.වි.පෙ) |
| **14.** | ගරු මන්ත්‍රී | කේ. හැරිසෙන්ස් මැතිතුමා | ( ජ.වි.පෙ) |
| **15.** | ගරු මන්ත්‍රී | ජී.ඒ නෙළුම් මැතිනිය | ( එ.ජා.ප) |
| **16.** | ගරු මන්ත්‍රී | ආර්.එම් කුමාරසිංහ මැතිතුමා | ( එ.ජා.ප) |
| **17.** | ගරු මන්ත්‍රී | ඩී.එම්.එන් සුභාෂිණී බංඩාර මැ.තිනිය | ( එ.ජා.ප) |
| **18.** | ගරු මන්ත්‍රී | ආර්.එම්.අයි ජනක ශ්‍රීමාලි මැතිනිය | ( එ.ජා.ප) |
| **19.** | ගරු මන්ත්‍රී | පී කරුණාරත්න මැතිතුමා | ( ශ්‍රී.ල නි.ප) |
| **20.** | ගරු මන්ත්‍රී | වයි.එම් ගාමිණී බංඩාර මැතිතුමා | (ස්වාධීන කණ්ඩායම) |

**දන්වා සහභාගී නොවූ:-**

| | | | |
|---|---|---|---|
| **01.** | ගරු මන්ත්‍රී | එම්.ඒ විමලසුරේන්ද්‍ර මැතිතුමා | ( එ.ජා.ප) |

**නිළධාරීන්:-**

| | | |
|---|---|---|
| **01.** | **ලේකම්** | **ජේ.ඒ.එස්.උදයසිරි මයා** |
| **02.** | **විෂය භාර කළමණාකරන සේවා නිළධාරී** | **මදූෂා අංජලී මෙය** |

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීතුමන්ලා හා ගරු මන්ත්‍රීතුමියන්ලා වෙත සුභ උදෑසනක් ප්‍රාර්ථනය කරමින්, ඉතාම ආදරයෙන් ගෞරවයෙන් පිළිගනිමින් න්‍යායපත්‍රානුකූලව සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

**අ) මහ සභා වාර්ථාව සභා සම්මත කර ගැනීම.**

**<u>2022.11.18 වන දින මහ සභා කෙටුම්පත් වාර්ථාව</u>**

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> 2022.11.18 දින පැවැත් වූ මහ සභා රැස්වීමේ කෙටුම්පත් වාර්තාව ප්‍රාදේශීය සභා රීතීන්ට අනුව ඔබ වෙත ලැබීමට සළස්වා ඇති බැවින් එම වාර්ථාවේ අඩුපාඩු ඇත්නම් සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කර ගන්නා ලෙස ප්‍රකාශ කරමින් 2022.11.18 මහ සභා කෙටුම්පත් රැස්වීම් වාර්ථාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා ඉදිරිපත් වූ සංශෝධනයන්ට යටත්ව 2022.11.18 වන දින පැවති මහ සභාවේ වාර්ථාව සංශෝධන වලට යටත්ව සභා සම්මත කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් ගෙන ආ යෝජනාව ස්ථිර කරන ලදී.
ඒ අනුව 2022.11.18 වන දින මහ සභා රුස්වීම් කෙටුම්පත් වාර්ථාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත විය.

**2022.11.10 වන දින විශේෂ මහ සභා කෙටුම්පත් වාර්ථාව**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා 2022.11.10 දින පැවැත් වූ විශේෂ මහ සභා රැස්වීමේ කෙටුම්පත් වාර්තාව ප්‍රාදේශීය සභා රීතීන්ට අනුව ඔබ වෙත ලැබීමට සළස්වා ඇති බැවින් එම වාර්ථාවේ අඩුපාඩු ඇත්නම් සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කර ගන්නා ලෙස ප්‍රකාශ කරමින් 2022.11.10 විශේෂ මහ සභා කෙටුම්පත් රැස්වීම් වාර්ථාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.
සංශෝධන
ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා විශේෂ මහා සභා වාර්තාව තුළ, කුමුදුනී බස්නායක මන්ත්‍රීතුමිය ස්ථිර කිරීම සිදුකර තිබෙන්නේ ගරු මන්ත්‍රීවරුන්ගේ අදහස් දැක්වීමෙන් පසුව බවත්, සභාපතිතුමා එහි අවසානයේ දී සංශෝධනයන්ට යටත්ව යනුවෙන් ප්‍රකාශ කළත් ඒ තුළ සංශෝධන මොනවාද යන්න අන්තර්ගත වී නොමැති බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී බී.බී.ඊ ගයාන් චාමර මැතිතුමා ඉදිරිපත් වූ සංශෝධනයන්ට යටත්ව 2022.11.10 වන දින පැවති විශේෂ මහ සභාවේ වාර්ථාව සංශෝධන වලට යටත්ව සභා සම්මත කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් ගෙන ආ යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව 2022.11.10 වන දින විශේෂ මහ සභා රුස්වීම් කෙටුම්පත් වාර්ථාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත විය.

**අ) සභාපතිතුමන් විසින් කරනු ලබන විශේෂ නිවේදනය**

පරිපාලන කටයුතු වෙනුවෙන් කර්මාන්ත ගිණුමෙන් පොදු ගිණුමට රුපියල් ලක්ෂ 10 ක මුදලක් මාරු කිරීමක් සිදු කර ඇති අතර ඒ පිළිබඳව ගරු මහා සභාවට දන්වන බව ප්‍රකාශ කරන ලදී.

**ආ) ප්‍රාදේශීය සභාව වෙත අමතා එවන ලද සංදේශ පෙත්සම්, පැමිණිලි සහ සන්නිවේදන**

**නැත.**

**ඇ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්ණ**

**නැත.**

**ඉ) යථා පරිදී කල් දී ඇති යෝජනා**

**01. 2023 ජනවාරි මස සේවකයින්ගේ අතිකාල තක්සේරු වාර්ථා අනුමත කිරීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා 2023 ජනවාරි මසට අදාලව කාර්යය මණ්ඩලය විසින් අතිකාල ඉල්ලීම් කර ඇති අතිකාල තක්සේරු වාර්ථා සභාවට ඉදිරිපත් කරමින් අදාල සේවකයින් වෙත අතිකාල තක්සේරු වාර්තා අනුමත කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

| නම | | පැය ගණන |
|---|---|---|
| 01. එස්.එම් මහරගෙදර මිය | (සහකාර ගිණුම් නිළධාරී) | 60 |
| 02. ඩී.යූ.දිසානායක මයා | (කළ.සේවා නිළධාරී) | 75 |
| 03. එම්.එස්.එම් ගුණවර්ධන මිය | (කළ: සේවා නිළධාරී) | 60 |
| 04. කේ.ජී.ඒ සම්මානි මෙය | (කළ.සේවා නිළධාරී) | 60 |
| 05. එම්.ඒ.දිසානායක මිය | (කළ.සේවා නිළධාරී) | 40 |
| 06. ටී.එච්.ආර් තාරක මයා | (කළ සහකාර (ආවරණ) | 40 |

07. ඒ.ඒ පියතිස්ස මයා (මා.කම්කරු (මුරකරු ආවරණ) 75
08. ඩබ්.එස්.එස්.ඒ.පෙරේරා (රියදුරු) 75
09. ඩී.එම්.ගුණරත්න බංඩා ( වැඩ පරිපාලක) 75
10. ටී.එච්.ඩී.ඩී පෙරේරා මයා (මුරකරු(ආවරණ) 75
11. බන්දුල දිසානායක (මුරකරු ආවරණ) 40
12. චමින්ද කුමාර (මුරකරු) 75
13. කේ.නයනානන්ද (ජල පෙරණ නෙළුබැව) 40
14. කේ.ජී.ජී.ඩී.ගමගේ ( පුස්තකාල සහයක) 40
15. එම්.පී.ඩී.ප්‍රියදර්ශනි. (කළ.සේවා නිළධාරී) 75
16. මානෙල් පුෂ්පකුමාරි ( පුස්තකාල සහයක) 40
17. ඩබ්ලිව්.තිලකරත්න ( පුස්තකාල සහයක) 40
18. එස්.අන්තෝනි ( සෞඛ්‍ය කම්කරු) 75
19. වාසනා වීරසිංහ මිය (කළ සහකාර (ආවරණ) 40
20. හිරන්ත මදුෂාන් (කළ සහකාර (ආවරණ) 40
21. රේණුකා රුක්ලන්ති ( පුස්තකාලාධිපති) 40
22. ඩී.පී.ඩී.එන්.එල්.රුක්ලන්ති (කළ සහකාර (ආවරණ) 40

ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා 2022 ජනවාරි මසට අදාල අතිකාල ඉල්ලුම් කර ඇති සේවකයින්ගේ අතිකාල තක්සේරු වාර්ථා අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපති තුමා කල යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා අතිකාල තක්සේරු වාර්තා අනුමත කිරීමේ යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතීද යන්න විමසූ අතර කිසිදු විරෝධතාවයක් ඉදිරිපත් නොවූ බැවින් 2022 ජනවාරි මස අතිකාල ඉල්ලුම්කල සේවකයින් වෙත අතිකාල තක්සේරු වාර්ථා අනුමත කිරීමේ යෝජනාව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

**02. .2023 වර්ෂයේ බලතල පැවරීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා 2023 වර්ෂයට අදාලව ගරු සභාපති ,ලේකම් හා සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී වෙත හා ආදායම් පරීක්ෂක, තාක්ෂණ නිළධාරී, තාක්ෂණ සහයක වෙත බලතල පැවරීමට අදාල යෝජනාව මහ සභාවට ඉදිරිපත් කරමින් එලෙස 2023 වර්ෂයට බලතල පැවරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

- **නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව සතු බලතල ක්‍රියාත්මක කිරීම ගරු සභාපති එස් බී කුමාරදාස මැතිතුමා වෙත පැවරීම**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතමා 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 03 වන වගන්තියට අනුව නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව එම ප්‍රදේශය ඇතුළත පළාත් පාලන ආයතන විය යුතු අතර මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත්, සාමාන්‍යයෙන් එම ප්‍රදේශය ඇතුළත ජනතාවගේ සුබ විහරණය, පහසුව සහ සුහසාධන යන සියලුම පහසුකම් ආරක්ෂා කිරීමට සහ ප්‍රවර්ධනය කිරීම ඇතුළු ඒ හා සම්බන්ද සියලු අනුසාංගික කටයුතු විධිමත් කිරීම පාලනය කිරීම හා පරිපාලනය කිරීම පිළිබඳ බලතල පැවරීම එම පනතේ 8(1) වගන්තිය යටතේ ගරු සභාපති එස්. බී කුමාරදාස මැතිතුමා වෙත පැවරීම සුදුසු බවට යෝජනා කරමි.

ඉන්ධන හා වාහන අළුත්වැඩියාවන් සඳහා හා කාර්යාලයේ ලිපි ද්‍රව්‍ය මිල දී ගැනීම සඳහා ගරු සභාපතිවරයාට එක් වරකට රු 100,000 සීමාව දක්වා වියදම් කිරීමටත්, මුදල් කමිටුවට රු 20,00,000 දක්වා කර්මාන්ත ගිවිසුම් ගත වීමට හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුල භාණ්ඩ හා සේවා මිල දී ගැනීමට බලතල පැවරීම ද සුදුසු බවට යෝජනා කරන ලදී.

➢ **<u>නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව සතු බලතල ක්‍රියාත්මක කිරීම ලේකම් වෙත පැවරීම</u>**

➢ නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා විසින් 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ අංක 8 (1) යටතේ තමා වෙත පැවරී ඇති බලතල වලින් එම වගන්තිය ii උප වගන්තිය අනුව මෙම ප්‍රාදේශීය සභාවේ ලේකම් ජේ.ඒ.එස්.උදයසිරි වන අය වෙත පැවරීමට යෝජනා කරමි.

➢ **<u>නැගෙනහිර නුවරගම් පළාතේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාශයේ සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී වෙත මහජන සෞඛ්‍යයට අදාළ නීති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය බලය පැවරීම</u>**

මහජන සෞඛ්‍යයට අදාළ රාජකාරිය ඉටු කිරීම සඳහා පහත සඳහන් පනත් හා ආඥා පනත් සහ සංශෝධන වලින් තමා වෙත පැවරී ඇති බලතල සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී වෙත පැවරීමට යෝජනා කරමි.

- 1901 අංක 25 දරණ සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥා පනත
- 1893 අංක 7 දරන ජලභීතිකා රෝග නිවාරණ ආඥා පනත
- 1862 අංක 15 දරන පීඩන ක්‍රියා ආඥා පනත
- 1893 අංක 9 දරණ ගෝ ඝාතක ආඥා පනත
- 1897 අංක 03 දරණ රෝග වැළැක්වීමේ හා නිරෝධන ආඥා පනත
- 1946 අංක 57 දරණ පොදු සුසාන භූමි සහ පුද්ගලික සුසාන භූමි පිළිබඳ ආඥා පනත
- 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 4 වන කොටසේ මහජන සෞඛ්‍ය පිළිබඳ පරිච්ඡේදයේ 79 - 104 දක්වා වගන්ති
- 1980 අංක 47 දරන මධ්‍යම පරිසර අධිකාරි පනත
- 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරි පනත

➢ **<u>නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව සතු බලතල ක්‍රියාත්මක කිරීම ආදායම් පරික්ෂකවරුන් වෙත පැවරීම</u>**

බල ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී කොට්ඨාශ 34 ට අදාලව ආදායම් එක්රැස් කිරීම සඳහා එම ස්ථානවලට පිවිසීම සහ ආදායම් එකතු කිරීම සඳහා ආදායම් පරීක්ෂකවරුන්හට බලය පැවරීමට යෝජනා කරමි.

➢ **<u>නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව සතු බලතල ක්‍රියාත්මක කිරීම සඳහා තාක්ෂණ නිළධාරී, තාක්ෂණ සහයක මහතුන් වෙත පැවරීම</u>**

බල ප්‍රදේශයේ සිදු කෙරෙන සියළු සංවර්ධන කටයුතු අධීක්ෂණය සහ ඊට අදාල අනෙකුත් කටයුතු සඳහාද,වීථි රේඛා නිකුත් කිරීම,නොපවරාගැනීමේ සහතික නිකුත් කිරීම,දීර්ඝ කාලීන බදු බලපත්‍ර සඳහා එකඟතාවය ලබාදීම,අනුබෙදුම් සහ මිනින්දෝරු සැලසුම් අනුමත කිරීම ,ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම,අනුකූලතා සහතික නිකුත් කිරීම,පරිසර බලපත්‍ර නිකුත් කිරීම,ආදී සියළු කාර්යයන් වෙනුවෙන් ස්ථානීය පරීක්ෂණ සිදු කිරීම සහ නිර්දේශ ලබාදීම වෙනුවෙන් එම දේපලවලට පිවිසීම සඳහා තාක්ෂණ නිලධාරීන් සහ තාක්ෂණ සහායක මහතුන්හට බලය පැවරීමටද යෝජනා කරමි.

➢ **<u>නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව සතු බලතල ක්‍රියාත්මක කිරීම සඳහා ආදයම් පරීක්ෂක නිළධාරිනියන් වෙත පැවරීම.</u>**

බල ප්‍රදේශයේ සිදු කෙරෙන සියළු ව්‍යාපාර බදු, කර්මාන්ත බදු, වෙළෙඳ බලපත්‍ර ගාස්තු, දැනවීම් පුවරු ගාස්තු, විනෝද බදු, පොළ සම්බන්ද බදු, වරිපනම් බදු හා ඉඩම් මත විකිනීම් බදු එකතු කිරීම, පරිසර බලපත්‍ර සම්බන්ද රාජකාරි හා ඒවා පැහැර හරින්නන් සම්බන්දව නීත්‍යානුකූලව කටයුතු කිරීමේ බලය පැවරීමටද යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා</u> සහා බල ප්‍රදේශය මාළු වෙළඳාම් කිරීම සඳහා බලය ලබාදීමට අවසර තිබෙන්නේ ගරු සභාපතිතුමාට බවත්, එම නිසා එවැනි වෙළදාම් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙසත් ප්‍රකාශ කරන ලදී.

ගරු උප සභාපති එම්.සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද 2023 වර්ෂයේ බලතල පැවරීමේ යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් 2023 වර්ෂයේ බලතල පැවරීමේ යෝජනාව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

**03. වාර්ෂික සැළසුම් අනුමත කිරීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා 2023 වර්ෂය තුල මෙම ප්‍රාදේශීය සභාවේ ක්‍රියාත්මක කිරීමට නියමිත සැළැසුම් මහ සභාවට ඉදිරිපත් කරමින් ඒ සඳහා සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරන ලදී.

01. සංවර්ධන සැළැස්ම 2023
02. ක්‍රියාකාරී සැළැස්ම 2023
03. අපද්‍රව්‍ය කළමණාකරන සැළැස්ම 2023
04. ප්‍රසම්පාදන සැළැස්ම 2023
05. අභ්‍යන්තර විගණන සැළැස්ම 2023
06. පුහුණු සැළැස්ම 2023
07. මානව සම්පත් කළමණාකරණ සංවර්ධන සැළැස්ම 2023

ගරු මන්ත්‍රී පී.එස්.බී.සිරිවර්ධන මැතිතුමා ඉදිරිපත් කල සැළසුම් අනුව 2022 වර්ෂයේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා කල යෝජනාව ස්ථිර කරන ලදී.
ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරුද්ධත්වයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් 2023 වර්ෂයේ වාර්ෂික සැළැසුම් අනුමත කිරීමේ යෝජනාව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

**04. 2023 වර්ෂය සඳහා කමිටු සාමාජිකයන් හා කමිටුවලට අදාල විෂය පථය තීරණය කිරීම.**

| මුදල් කමිටුව | | |
|---|---|---|
| 01 | කමිටු සභාපති | ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා |
| | කමිටු සමාජික | ගරු උප සභාපති එම්.සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා |
| | කමිටු සමාජික | ගරු මන්ත්‍රී කේ.ඒ ශාන්ත මැතිතුමා |
| | කමිටු සාමාජික | **ගරු මන්ත්‍රී පී.ටී සිරිසේන මැතිතුමා** |
| | කමිටු සාමාජික | **ගරු මන්ත්‍රී පී කරුණාරත්න මැතිතුමා** |
| | කමිටු සාමාජික | **ගරු මන්ත්‍රී ඩී.එම්.එන් සුභාෂිණි බංඩාර මැ.තිනිය** |
| | ලේකම් | ජේ.ඒ.එස්.උදයසිරි මයා |

| පරිසර කමිටුව | | |
|---|---|---|
| 02 | කමිටු සභාපති | ගරු මන්ත්‍රී ජේ.ඒ.ඩී විමලසිරි මැතිතුමා |
| | කමිටු සමාජික | ගරු මන්ත්‍රී කේ.ඒ.සංජීව මැතිතුමා |
| | කමිටු සමාජික | **ගරු මන්ත්‍රී ආර්.එම්.අයි ජනක ශ්‍රීමාලි මැතිනිය** |
| | කමිටු සමාජික | **ගරු මන්ත්‍රී එස්.ඒ.කේ.පී ගුණවර්ධන මැතිතුමා** |
| | කමිටු සාමාජික | පරිසර නිළධාරී 02 |
| | කමිටු සාමාජික | ප්‍රාදේශීය සභාවට අයත් PHI නිළධාරීන් 05 |

| තාක්ෂණ කමිටුව | | |
|---|---|---|
| 03 | කමිටු සභාපති | උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා |
| | කමිටු සමාජික | ගරු මන්ත්‍රී එච්.ඩබ්.ජී.එන්.කුමුදු වසන්ති මැතිණිය |
| | කමිටු සමාජික | **ගරු මන්ත්‍රී ජී.ඒ නෙළුම් මැතිනිය** |
| | කමිටු සමාජික | **ගරු මන්ත්‍රී කේ. හැරිසෙන්ස් මැතිතුමා** |
| | කමිටු සාමාජික | තාක්ෂණ නිළධාරි අරුණ ද අල්විස් මයා |
| | කමිටු සාමාජික | තාක්ෂණ සහයක තරංග නිෂාසිරි මයා |
| | කමිටු සාමාජික | ටී.එච්.ආර් තාරක මයා |

| සැළසුම් කමිටුව | | |
|---|---|---|
| 04 | කමිටු සභාපති | ගරු මන්ත්‍රී ජේ.ඒ.ජයවර්ධන මැතිතුමා |
| | කමිටු සමාජික | ගරු මන්ත්‍රී බී.ඒ.ජී.එම්.කේ.ජී.ජී.කුමාරි මැතිණිය |
| | කමිටු සමාජික | **ගරු මන්ත්‍රී වයි.එම් ගාමිණී බංඩාර මැතිතුමා** |
| | කමිටු සමාජික | **ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා** |
| | කමිටු සාමාජික | කේ චන්ද්‍රසේකර මිය සංවර්ධන නිළධාරි |
| | කමිටු සාමාජික | ප්‍රජා සංවර්ධන නිළධාරි ආරියරත්න මයා |
| | කමිටු සාමාජික | තාක්ෂණ සහයක තරංග නිෂාසිරි මයා |

| ප්‍රසම්පාදන කමිටුව | | |
|---|---|---|
| 05 | කමිටු සභාපති | ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා |
| | කමිටු සමාජික | **ගරු මන්ත්‍රී බී.බී.ඊ ගයාන් චාමර මැතිතුමා** |
| | කමිටු සමාජික | **ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා** |
| | කමිටු සමාජික | ජේ.ඒ.එස්.උදයසිරි මයා |
| | කමිටු සාමාජික | පළාත් පාලන විමර්ෂණ නිළධාරි |

| ළමා හා කාන්තා කමිටුව | | |
|---|---|---|
| 06 | කමිටු සභාපති | ගරු මන්ත්‍රී බී.ඒ.ඩී.එම්.කේ.ජී.ජී කුමාරිහාමි මැතිණිය |
| | කමිටු සමාජික | ගරු මන්ත්‍රී කුමුදු වසන්ති මැතිණිය |
| | කමිටු සමාජික | ගරු මන්ත්‍රී ජී.ඒ නෙළුම් මැතිණිය |
| | කමිටු සමාජික | ගරු මන්ත්‍රී ආර්.එම්.අයි ජනක ශීමාලි මැතිණිය |
| | කමිටු සාමාජික | ගරු මන්ත්‍රී සුභාෂිණී බණ්ඩාර මැතිණිය |

**මුදල් හා ප්‍රතිපත්ති කමිටුව (මුදල් කමිටුව)- විෂය පථය**

**01.** රු 50,00,000 දක්වා සියළු ප්‍රසම්පාදන කටයුතු සඳහා අනුමැතිය ලබා දීම.
**02.** ප්‍රසම්පාදන මණ්ඩලය ලෙස කටයුතු කිරීම හා කැඳවීමට නිර්දේශ ලබා දීම
**03.** ගෙවීම් වාර්ථා ආදායම් වියදම් වාර්ථා සම්බන්ධ නිර්දේශය ලබා දීම.
**04.** ඉදි කිරීම් හා සංවර්ධන කටයුතු සම්බන්ධ නිර්දේශ ලබා දීම.

**පරිසර හා පහසුකම් පිළිබඳ උපදේශක කමිටුව (පරිසර කමිටුව) - විෂය පථය**

**01.** බල ප්‍රදේශයේ පවතින පරිසර ගැටළු සම්බන්ධව මහ සභාවට නිර්දේශ ලබා දීම.

**02.** පරිසර බලපත්‍ර පිළිබඳ ගැටළු සම්බන්ධ නිර්දේශ ලබා දීම.

**03.** මහජන සෞඛ්‍ය හා සනීපාරක්ෂක කටයුතු පිළිබඳ ගැටළු සම්බන්ධ නිර්දේශ ලබා දීම.

**04.** කසල කළමනාකරණය සම්බන්ධ කටයුතු පිළිබඳ ගැටළු සම්බන්ධ නිර්දේශ ලබා දීම.

**05.** සුසාන භූමි, ක්‍රීඩා පිටි සම්බන්ධ ගැටළු සඳහා නිර්දේශ ලබා දීම.

**කාර්මික සේවා සම්බන්ධ උපදේශක කමිටුව (තාක්ෂණ කමිටුව) - විෂය පථය**

**01.** ඉදි කිරීම් සම්බන්ධ ගැටළු වල දී නිර්දේශ ලබා දීම.

**02.** මංමාවත් සම්බන්ධ ගැටළු වල දී නිර්දේශ ලබා දීම.

**03.** වාහන හා යන්ත්‍ර සූත්‍ර සම්බන්ධ ගැටළු වල දී නිර්දේශ ලබා දීම.

**04.** අනවසර ඉදි කිරීම් සම්බන්ධ ගැටළු වල දී නිර්දේශ ලබා දීම.

**05.** වීථි ලාම්පු සම්බන්ධ ගැටළු වල දී නිර්දේශ ලබා දීම.

**නිවාස, ප්‍රජා සංවර්ධන හා සැළසුම් කමිටුව- විෂය පථය**

**01.** ව්‍යාපෘති වාර්ථා සකස් කිරීම සඳහා මග පෙන්වීම් හා නිර්දේශ ලබා දීම

**02.** ප්‍රජාව සම්බන්ධ වැඩසටහන් පැවැත්වීමේදී ඊට අදාල නිර්දේශ ලබා දීම

**03.** බල ප්‍රදේශයේ මාර්ග පද්ධතීන්, ආකර්ෂණීයව පවත්වාගෙන යාමට උපදෙස් හා යෝජනා ලබා දීම.

**04.** දීර්ඝ කාලයක සිට අවිධිමත් ලෙස කරන ලද අනවසර ඉදි කිරීම් හේතු කරගෙන පැන නැගී ඇති ගැටළු සම්බන්ධ යෝජනා හා නිර්දේශ ලබා දීම.

<u>ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා</u> 2023 වර්ෂය සඳහා කමිටු සාමාජිකයින් හා කමිටු වලට අදාල විෂය පථය තීරණය කිරීම සම්බන්ධයෙන් වූ යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරුද්ධත්වයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් 2023 වර්ෂය සඳහා කමිටු සාමාජිකයන් හා කමිටුවලට අදාල විෂය පථය තීරණය කිරීමේ යෝජනාව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

**05. 2023 වර්ෂය සඳහා විගණන කළමණාකරණ කමිටුව පත් කිරීම.**

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> 2023 වර්ෂය වෙනුවෙන් පත් කල යුතුව පවතින විගණන කළමනාකරණ කමිටුව වෙනුවෙන් කාර්යාලයේ නිළධාරී කණ්ඩායමක් පත් කල යුතු බවත් ඒ සඳහා වන විගණන කළමනණාකරණ කමිටු සංයුතිය ඉදිරිපත් කරමි.
කමිටුවේ සංයුතිය:-

01. ගරු සභාපති
02. ලේකම්
03. විගණන දෙපාර්තමේන්තුවේ නිළධාරියා
04. පළාත් පාලන දෙපාර්තමේන්තුවේ විමර්ෂණ නිළධාරී
05. ප්‍රධාන කළමනාකරණ සේවා නිළධාරී
06. සහකාර ගිණුම් නිළධාරී
07. අභ්‍යන්තර විගණන නිළධාරී
08. තාක්ෂණ නිළධාරී

ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද 2023 වර්ෂය සඳහා විගණන කළමනාකරණ කමිටුව පත් කිරීමේ යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරුද්ධත්වයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් 2023 වර්ෂය සඳහා විගණන කළමණාකරණ කමිටුව පත් කිරිමේ යෝජනාව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

**06. 2023 වර්ෂය සඳහා මහා සභාව හා කමිටු පැවැත්වෙන දින ඇතුලත් කාලසටහන ඉදිරිපත් කිරීම.**

| මාසය | මහ සභාව | මුදල් කමිටුව | පරිසර උපදේශක කමිටුව | සැලසුම් උපදේශක කමිටුව | තාක්ෂණික උපදේශක කමිටුව | උපදේශක කාරක සභාව | ළමා හා කාප කමිටුව |
|---|---|---|---|---|---|---|---|
| ජනවාරි | **2023.01.17** | **2023.01.10** | **2023.1.23** | | | | |
| පෙබරවාරි | **2023.02.17** | **2023.02.07** | | | | **2023.2.21** | **2023.2.21** |
| මාර්තු | **2023.03.17** | **2023.03.07** | | **2023.3.21** | **2023.3.21** | | |
| අප්‍රේල් | **2023.04.21** | **2023.04.06** | | | | | |
| මැයි | **2023.05.19** | **2023.05.09** | | | | **2023.5.23** | |
| ජූනි | **2023.06.16** | **2023.06.06** | **2023.6.21** | **2023.6.21** | | | |
| ජූලි | **2023.07.21** | **2023.07.07** | | | | | |
| අගෝස්තු | **2023.08.18** | **2023.08.08** | | | | **2023.8.22** | **2023.8.22** |
| සැප්තැම්බර් | **2023.09.15** | **2023.09.08** | **2023.9.20** | | **2023.9.20** | | |
| ඔක්තෝම්බර් | **2023.10.20** | **2023.10.06** | | | | **2022.10.24** | |
| නොවැම්බර් | **2023.11.17** | **2023.11.07** | | | | | |
| දෙසැම්බර් | **2023.12.15** | **2023.12.08** | | **2023.12.20** | | | |

ගරු මන්ත්‍රී කේ.ජ් සංජීව මැතිතුමා ගරු සභාපතිතුමා විසින් ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලද 2023 වර්ෂය සඳහා මහා සභාව හා කමිටු පැවැත්වෙන දින ඇතුලත් කාල සටහන ඉදිරිපත් කිරීමේ යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් 2023 වර්ෂයේ මහ සභාව හා කමිටු පැවැත්වෙන දින ඇතුළත් කාල සටහන ඉදිරිපත් කිරීමේ යෝජනාව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

. **07. හිග බිල්පත් නිරවුල් කිරීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතමා හිග බිල්පත් සම්බන්ධව ලංකා විදුලිබල මණ්ඩලයෙන් ලිපිය යොමු කර ඇති බවත්, ඒ අනුව නෙලුබැව රෝහල අසල කිරිහල ට අදාළ විදුලි සේවාවන්ද 2022 පෙබරවාරි මස වන විට අවලංගු කර ඇති අතර මෙහි ශේෂය ලෙස රුපියල් 11,840.02 ක් ලෙස පවතින බවත්, ලංකා විදුලිබල මණ්ඩලයෙන් දන්වා ඇති අතර එම ගෙවීම සහා අරමුදලින් ගෙවීම සුදුසු බවත්, උතුරු මැද පළාතේ ප්‍රධාන අමාත්‍යාංශය මගින් ද පහේ ඇල හංදිය අනුරාධපුර පිහිටි කිරි හල සම්බන්ධ හිග බිල්පත් නිරවුල් කිරීමක් පවතින බව දන්වා ඇති අතර, මෙම ගෙවීම් කිරීම ද ලංකා විදුලිබල මණ්ඩලයට ගෙවීමට පවතින බවත් එම අදාල රුපියල් 3,708.82 ක මුදලද සභා අරමුදලින් ගෙවා නිරවුල් කිරීම සුදුසු බවත්, නෙලුබැව, ප්‍රජා ශාලාව ගොඩනැගිල්ල, ශ්‍රාවස්තිපුර යන ස්ථානයට අදාළව ද ලංකා විදුලිබල මණ්ඩලය වෙත රුපියල් 15,568.77 හිග බිල්පතක් පියවීමට ඇති අතර ඒ මුදලද සභා අරමුදලින් පියවා අවසන් කිරීම සුදුසු බවත්, ශ්‍රාවස්තිපුර ප්‍රාදේශීය සභා උප කාර්යාලයේ ජාතික ජල ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය ට අදාල හිඟ ජල බිල්

පතක් පියවීමට ඇති අතර එම මුදල රුපියල් 1,878.03 ක් බවත් එම ගෙවීම් කිරීම ද සහා අරමුදලින් ගෙවා අවසන් කිරීම සුදුසු බවත් පවසන අතර අදාල පුද්ගලයින් සම්බන්ධයෙන් වෙනම ක්‍රියාමාර්ග ගන්නා බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා මෙම කිරි හලවල් බදු දුන් ස්ථාන වන අතර එම බදු ගිවිසුමට අදාළව විදුලි බිල්පත පියවීමේ වගකීම පවතින්නේ බදු පදනමෙන් ලබාගත් පුද්ගලයින් වෙත බවත්, එම නිසා අදාළ ගෙවීම් කිරීමට ඔවුන් දැනුවත් කිරීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා බදු පදනමෙන් ලබාගත් පුද්ගලයින් දැනුවත් කළ විට, පසුගිය කාලයේ රටේ පැවැති ආර්ථික අස්ථාවරත්වය මත ඔවුන්ට නිසි පරිදි වෙළඳාම සිදු කිරීමට නොහැකි වූ බව පවසන බවත් , එමෙන්ම විදුලිබල මණ්ඩලයෙන් සභාව වෙත නිරන්තරයෙන් ලිපි මඟින් මේ පිළිබඳව දන්වන බවත්, එම නිසා අදාළ ගෙවීම් සිදුකර තමා බදු පදනමෙන් පදනමෙන් ලබාගත් පාර්ශව පිළිබඳව නීතියානුකූලව ක්‍රියාමාර්ග ගන්නා බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා ගරු සභාපතිතුමා විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද හිග බිල්පත් නිරවුල් කිරීමේ යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් හිග බිල්පත් නිරවුල් කිරීමේ යෝජනාව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

### 08.පුස්තකාල උපදේශන කමිටුව පත් කිරීම.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා

**නාච්චාදූව ප්‍රාදේශීය ලේකම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙ නෙලුබෑව පුස්තකාලය සඳහා කමිටු සාමාජිකයින්.**

- කමිටු සභාපති - ගරු සභාපති එස් බී කුමාරදාස මැතිතුමා.
- ගරු මන්ත්‍රීවරුන් - ගරු උපසභාපති සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා
- ගරු මන්ත්‍රී කේ එස් සංජීව කළුආරච්චි මැතිතුමා.
- ගරු මන්ත්‍රි එච් .ඩබ්ලිව් .ජී .එන්. වසන්ති මැතිනිය.
- හිදෝගම කුඩා නෙළුබෑව විශ්‍රාමික නියෝජ්‍ය විදුහල්පති එච්. ඒ. ප්‍රේමරත්න මහතා
- ශ්‍රාවස්තිපුර 5 ඇළ සංවර්ධන නිලධාරී චමිලා ප්‍රියදර්ශනීය මිය.
- ශ්‍රාවස්තිපුර ආමනේ පෙර පාසල් ගුරු ලීලා සිංහාරගේ මිය.
- හිදෝගම විසි එකේ ඇල සංවර්ධන නිලධාරී සරත් රණසිංහ මහතා.
- ශ්‍රාවස්තිපුර කළමනාකරණ සහකාර චම්පා සිරිවර්ධන මිය.
- ශ්‍රාවස්තිපුර පුස්තකාලය ගීතිකා මිය (පුස්තකාල සහයක)

**නැ.නු.ප. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අදාළව 9 ඇල පුස්තකාලය හා ප්‍රාදේශීය සභා පුස්තකාලය සඳහා කමිටු සාමාජිකයින්.**

- ගරු සභාපති එස් බී කුමාරදාස මැතිතුමා
- ගරු මන්ත්‍රී කේ.ඒ. ශාන්ත මැතිතුමා
- ගරු මන්ත්‍රී කුමුදුනි බස්නායක මැතිණිය
- ගරු මන්ත්‍රී බී.බී.ඊ. ගයාන් චාමර මැතිතුමා.
- විජේපුර බණ්ඩාරනායක මාවතේ සිරිධම්ම තිලක විහාරයේ පූජ්‍ය සිංහාරගම අමිත හිමි.

- අභයපුර අංක දෙක විශ්‍රාමික නිලධාරී ටී.එස්. ආනන්ද මයා
- අනුරාධපුර ජනාධිපති විද්‍යාලයේ උපගුරු ඩබ්. ඒ. දර්ශන කුමාරසිංහ මයා.
- විජයපුර බණ්ඩාරනායක මාවත විවාහ හා මරණ රෙජිස්ටාර් පත්මා මැදිවක මිය.
- විජයපුර 243 ග්‍රාම නිලධාරීන් ඩී. දයානන්ද මයා.
- ප්‍රාදේශීය සභා මහජන පුස්තකාලයේ පුස්තකාලාධිපති රේණුකා රුක්ලන්ති මිය.
- 9 ඇල පාර මහජන පුස්තකාලයේ මානෙල් පුෂ්ප කුමාරි මිය ( පුස්තකාල සහායක)

ගරු මන්ත්‍රී බී.බී.ඊ ගයාන් චාමර මැතිතුමා සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද පුස්තකාල උපදේශන කමිටුවට අදාල යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් පුස්තකාල උපදේශන කමිටුව පත් කිරීමේ යෝජනාව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය

**09. ශ්‍රාවස්තිපුර මෙටල් ක්‍රශර් ආයතනයට ගල් කුඩු සඳහා ගෙවීමට ඇති බිල්පත් සම්බන්ධව.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ශ්‍රාවස්තිපුර මෙටල්ක්‍රශර් ආයතනයේ ගෙවීමට ඇති බිල්පත් පිළිබඳ වාර්තාව ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදී.ඒ අනුව මිල විචලනයන් සිදුවී ඇත්තේ අදාල කාලයේදී රට තුළ පැවති ආර්ථික මිල විචලතාවය මත බවත් ප්‍රකාශ කරන ලදී. ඒ අනුව මෙම ගෙවීම් කිරීම ගරු මහ සභාවේ හා මුදල් කමිටුවේ අනුමැතියට යටත්ව ගෙවීම් කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී. මේ පිළිබඳව අභ්‍යන්තර විගණන නිලධාරි විසින් ද නිවැරදි බවට ඉදිරිපත් කරුඇති බවත් පවසන ලදී.

ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා අදාල සැපයුම්කරුවා විසින් මුදල් කමිටුවට ඉදිරිපත් කර ඇති මිලට අනුව ගල් කුඩු ලබාදීමට හැකි නිසා එම මිල ඉදිරිපත් කර ඇති බවත්, පසුව මිල විචලතාවයන් සිදුවන්නේ නම් ඒ කාලයේ පැවති මුදල් කමිටු වලට එම මිල පිළිබඳව වාර්තා ලබා දීමට අවස්ථාව තිබුණු බවත්, බොහෝ කාලයකට පසුව මිල විචලතා සිදුවුණා යැයි පවසා වැඩි මිල සහිතව ඉදිරිපත් කිරීම නුසුදුසු බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී එස්.ඒ.කේ.පී ගුණවර්ධන මැතිතුමා මෙහි පවතින්නේ අවස්ථා කිහිපයකදී ලබාගත් ගල් කුඩු වුවත්, මිල පිළිබඳව වරින් වර වෙනස් වීමක් සිදුවුණේ නම්, අදාල කාල වල දී ඒ පිළිබඳව බිල්පත් මගින් දැනුවත් කර තිබේ නම් ගැටළුවක් නොමැති බවත්, නමුත් සියලු මිලදී ගැනීම අවසන් වීමෙන් පසුව මේ ආකාරයට මිල විචලතාවයන් ඉදිරිපත් කිරීම යෝග්‍ය නොවන බවත් ප්‍රකාශ කරන ලදී. මෙම මිල විචලතාවය පිළිබඳව නැවත වාර්තාවක් ඉදිරිපත් කිරීම සුදුසු බවත් පවසන ලදී.

ගරු මන්ත්‍රී පී.එස්.බී සිරිවර්ධන මැතිතුමා අදාළ ව්‍යාපාරිකයා මිල විචලතාවයන් සිදුකරන්නේ නම්, ඊලග සේවාව සැපයීමේදී කලින් මිලට ලබාදීමට නොහැකි බව එම කාලයේ පවතින මුදල් කමිටුව වෙත ඉදිරිපත් කිරීම යෝග්‍ය බවත්, මේ තුළ එම ක්‍රියාව සිදු වී තිබේද යන්න පිළිබඳව සොයා බලා නැවත වතාවක් ඊළඟ මහ සභාවට ඉදිරිපත් කිරීම සුදුසු බවට ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා අදාල ගෙවීම් පිළිබඳ වාර්තාව නැවත පරීක්ෂා කර බලා පැහැදිලි වාර්තාවක් ඊළඟ මහ සභාවට ඉදිරිපත් කිරීම සුදුසු බවට ප්‍රකාශ කරන ලදී.

**10. තුරුලිය සෙවන නිවාඩු නිකේතනය සම්බන්දව.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතමා. තුරුලිය සෙවන නිවාඩු නිකේතනය වසර 3ක් සඳහා වාර්ෂිකව ගිවිසුම් අත්සන් කිරීමේ බදු පදනම මත ලබා දී තිබූ අතර එම කාලය මෙම වසරේ දෙසැම්බර් 31 දිනෙන්

අවසන් වනු ඇත,එබැවින් තුරුලිය සෙවන නිවාඩු නිකේතනය 2023 වර්ෂයට බදු පදනම මත ලබා දීමට දෙවරක් ටෙන්ඩර් පත් කැඳවුවද එය සඳහා කිසිඳු ලංසුපතක් ඉදිරිපත් වී නැත.එබැවින් මෙම තුරුලිය සෙවන නිවාඩු නිකේතනයේ ඉදිරි කටයුතු සඳහා උපදෙස් පතන බවත්,තවද මේ සම්බන්ධයෙන් එක් සේවකයකු පැය 24 ම සේවයේ යෙදවීම තුල කම්කරු ප්‍රඥප්තිය උල්ලංඝණය වන බැවින් නිවාඩු නිකේතන භාරකරු ලෙස පත්වීමක් ලබාදීමටත් සෑම කාමරයක් හෝ සම්පූර්ණ නිවාඩු නිකේතනයම වෙන්කර ගැනීමේදි භාරකරු විසින් සභාව වෙත දුරකථන මාර්ගයෙන් දැනුම් දිමේ ක්‍රමවේදයක් සකස් කළ යුතු බවත් පවසන ලදි.

<u>ගරු මන්ත්‍රී පී.එස්.බී සිරිවර්ධන මැතිතුමා</u> තුරුලිය සෙවන නිවාඩු නිකේතනය පිළිබඳව සිදු නොවුණත් වැරදි අදහස් සමාජගත වී ඇති බැවින් ඒ පිළිබඳව වැඩි අවධානයක් යොමු කළ යුතු බවත්, කලින් ටෙන්ඩර් මගින් ලබාදුන් කාලයේදී නිවාඩු නිකේතනයට බොහෝ අලාභහානි සිදුවී පවතින බවත්, මේ සඳහා සේවකයෙකු යොදවන්නේ නම් ඔහුට සිදුකරන ගෙවීම කොපමණද යනුවෙන් විමසූ අතර නිවාඩු නිකේතනය යම් පුද්ගලයකුට ලබාදෙන විට ඒ පිළිබඳව සභාවට එම අවස්ථාවේදීම දුරකථන මාර්ගයෙන් ලබා දීම සුදුසු බවත්, අදාළ පුල පුද්ගලයාගේ හැඳුනුම්පත් අංක සහ තොරතුරු ලබාගැනීම අනිවාර්ය කිරීම යෝග්‍ය බවත් ප්‍රකාශ කරන ලදී. ඒ අනුව සභාපති තුමා විසින් ඉදිරිපත් කළ යෝජනාව ස්ථිර කරන ලදි.

<u>ගරු මන්ත්‍රී එස්.ඒ.කේ.පී ගුණවර්ධන මැතිතුමා</u> තුරුලිය සෙවන නිවාඩු නිකේතනයට සුදුසු පරිදි සේවකයකු යොදවා සභාවේ අධීක්ෂණය යටතේ නිසි ක්‍රමවේදයට පවත්වාගෙන යෑම යෝග්‍ය බවත්, ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ස්ථිර කරන බවත් ප්‍රකාශ කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා</u> ගිවිසුම් ප්‍රකාරව මාස තුනක් ගෙවීම් සිදු නොකරන්නේ නම් ගිවිසුම අවලංගු වන බවත්, භාණ්ඩ අලාභ හානිය පිළිබඳව වාර්තාවක් සකස් කර තිබේද යනුවෙනුත් විමසන ලදී. තුරුලිය සෙවන නිවාඩු නිකේතනය නැවත බංගලා භාරකරුවෙකු හරහා පවත්වාගෙන යන්නේ නම් කාර්යාල වේලාවට අමතරව සේවයේ යොදවන්නේ කෙසේද යනුවෙන් විමසූ අතර, අනියම් සේවකයෙකු යොදාගෙන මෙය සිදුකරන්නේ නම්, එම පුද්ගලයා හට බාහිර ආයතනයක හෝටල් සාත්තු සේවාව පිළිබඳව පුහුණුවක් ලබාදීම සුදුසු බවත්, සභාවෙන් යම් මුදලක් වැය කර හෝ පවතින තත්වය යහපත් අලංකාර සිත් ඇදගන්නාසුලු ලෙසට සකස් කළ යුතු බවත්, ඉන් පසුව ජනතාව අතර මෙම තුරුලිය සෙවන නිවාඩු නිකේතනය පිළිබඳව ප්‍රචාරය කිරීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා</u> සේවක කළමනාකරණය පිළිබඳව වෙනම පාඨමාලා අවශ්‍ය නොවන බවත් සේවකයින් පාලනය කිරීම සඳහා සභාපතිතුමාට බලය පවතින බවත්, අනුරාධපුරය පූජා නගරයක් නිසා මෙම නිවාඩු නිකේතනය පූජාවන් පැවත්වීමට එන බැතිමතුන්ට පූජාවන් සකස් කර ගැනීම ප්‍රමුඛම මුල් කාලයේදී නිර්මාණය කළ බවත්, වර්තමානයේ මෙහි වූ සිදුවීම් සමග කනගාටු වන බවත්, එම නිසා නිවැරදි තීරණ ගෙන, ගිවිසුමකට ප්‍රකාරව මෙම ආයතනය ලාභ උපයන ආයතනයක් ලෙස පවත්වා ගෙන යාම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතමා</u> මෙම ස්ථානය සඳහා අප ප්‍රාදේශීය සභාවේ සේවය කරන අනියම් සේවකයෙකු යොදවා ඔහුට මෙම ආදායමෙන් 10% ක් හෝ 20% ක් ලබාදී පවත්වාගෙන යාමට අපේක්ෂා කරන බවත් ප්‍රකාශ කරන ලදී.ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ තුරුලිය සෙවන නිවාඩු නිකේතනය සම්බන්ද යෝජනාව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

**11. හතේ ඇල කඩ කාමර 5 සහ ශ්‍රාවස්තිපුර කඩ කාමර 12 සම්බන්ධව.**

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතමා</u> 7 ඇළ කඩ කාමර (05) හා ශ්‍රාවස්තිපුර කඩ කාමර (12), 2023 වර්ෂයට බදු පදනම මත ලබා දීමට දෙවරක් ටෙන්ඩර් පත් කැඳවුවද මෙම කඩ කාමර දැනට පවත්වාගන යන පුද්ගලයින් විසින් ලංසුපත් ඉදිරිපත් කිරිමෙන් වැළකි ඇති අතර වෙනත් පුද්ගලයින් විසින්ද ටෙන්ඩර් ලංසුපත් ඉදිරිපත් කිරිමක් සිදුවී නැත.එබැවින් මෙම කඩ කාමර සභාවට පවරාගන්නේද නැතහොත් මෙම කඩ කාමර

දැනට පවත්වාගන යන ව්‍යාපාරිකයින් දීර්ඝ කාලයක් තිස්සේ පවත්වාගන යන බැවින් පැවති ආකාරයටම(තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරු ගත මාසික කුලී පදනම මත) ලබාදෙන්නේද යන්න උපදෙස් පතන බවත්, මීට අමතරව මෙම ඉඩම් පිළිබඳ අයිතියක් සභාව සතු නොවුනද සභාවේ භාරකත්වය තුල පවතින බැවින් මෙම මහ සභාවේ තීරණය මත මෙතෙක් කරගන එන ව්‍යාපාරකයින් හට ලබාදීම සුදුසු බව යෝජනා කරමි.තවද මේ සම්බන්ධයෙන් ගරු ආණ්ඩුකාර තුමා වෙත නිර්දේශයක් ලබා දෙන ලෙස කිහිප වතාවක් ඉල්ලීම්කර ඇති අතර අනුමැතිය ලබාදීම ප්‍රතික්ෂේප කර ඇති බැවින් සභාවේ අනුමැතිය මත ක්‍රියාත්මක කිරිම සඳහා යෝජනා සම්මතකර දෙන ලෙස ගෞරවයෙන් ඉල්ලා සිටින බවත් පවසන ලදි

ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා මෙම කඩකාමර තක්සේරුවක් සිදු කර, තක්සේරු ගත මුදල ප්‍රාදේශීය සභාව වෙත ගෙවා අවසන් කළ පසු ස්ථිරවම ලබා දීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී.එහිදී තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරු ගත මුදලට තවත් මුදලක් එකතු කර හෝ අදාළ අයකර ගැනීම සිදු කළ හැකි බව පවසන ලදී.

ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද කඩ කාමර සම්බන්ධ යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් හතේ ඇල කඩ කාමර 5 සහ ශ්‍රාවස්තිපුර කඩ කාමර 12 සම්බන්ධ යෝජනාව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මිත විය.

**12. මාළු වෙළඳාම් කිරීම සඳහා වූ අභියාචනය**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා නෙළුම්කුලම මහඇළ අසල මාළු ලැල්ල සඳහා එස්.එන්.බී.එම්.පී.විජයරත්න යන අය විසින් ටෙන්ඩර් කාලය තුලදී ලංසුපත් යොමුකිරිමට නොහැකි වූ බැවින් එම ස්ථානයේ මාළු වෙළඳාම් කිරිමට අවස්ථාවක් ඉල්ලා අභියාචනයක් ඉදිරිපත් කර ඇත.මෙම ස්ථානයේ 2022 වර්ෂයට අදාලව ටෙන්ඩර් අයදුම්කරුගේ හිඟයක් පවතින බැවින් මෙම නෙළුම්කුලම මහ ඇළ අසල මාළු ලැල්ල 2023 වර්ෂයට බදු පදනම මත ලබා දෙන මෙන් ඉල්ලා සිටින බවත් පවසන ලදි.

ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද මාළු වෙළඳාම් කිරීම සඳහා වූ අභියාචනයට අදාළ යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් මාළු වෙළඳාම් කිරීම සඳහා වූ යෝජනාව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

**13. අඩු ආදායම් ලාභි පවුල් වල පාසල් සිසුන් සඳහා පොත් ලබා දීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා වර්තමානයේ රටේ පැවති ආර්ථික අර්බුදයත් සමඟ අඩු ආදායම් ලාභි පවුල් වල පාසල් සිසුන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා දිරිමත් කිරීමක් වශයෙන් හඳුනාගත් පාසල් සිසුන් වෙත අධ්‍යාපන පොත් ලබා දීමේ වැඩසටහනක් අරම්භ කිරීම සඳහා රුපියල් 1,500,000.00 ක උපරිමයකට යටත්ව මෙම ප්‍රතිපාදන වෙන් කිරීම සඳහා සභාවේ අනුමැතියට ඉදිරිපත් කරන ලදි. මේ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන නොමැති අතර මාරු කිරීමක් වශයෙන් මුදල් ලබා දීම සිදු කළ හැකි බවත්, පවසමින් අඩු ආදායම්ලාභී පවුල්වල පාසල් සිසුන් සඳහා පොත් ලබා දීමේ යෝජනාව ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා අඩු ආදායම්ලාභී පාසල් දරුවන් වෙත පොත් ලබාදීමේ මෙම වැඩසටහන් සුභවාදී යෝජනාවක් බවත්, මෙම පාසල් පොත් ලබා දීමේදී අඩු ආදායම්ලාභී දරුවන් තෝරා ගැනීම සඳහා දේශපාලන පදනමකින් තොරව සත්‍ය ලෙසම අඩු ආදායම්ලාභී දරුවන් නිශ්චිත ලෙස සනාථ

කරගෙන ලබාදීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී . ලබාදෙන පාසල් පොත් අදාල ශිෂ්‍යයන් වෙත නිශ්චිතවම ලබා දුන්නේද යන්න නිශ්චය කර ගන්නේ කෙසේද යනුවෙන් විමසන ලදී.

ගරු මන්ත්‍රී බී.බී.ඊ ගයාන් චාමර මැතිතුමා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද අඩු ආදායම්ලාභී සිසුන් වෙත පොත් ලබා දීමේ යෝජනාවක්ව ස්ථිර කරන ලදී. පාසල් සිසුන් වෙත පොත් ලබා දීමේදී අදාල ශ්‍රේණි සඳහා නියමිත පොත් තීරණය කර ලබා දිය යුතු බවත්, පොත් ලබා දීමේදී එක් මන්ත්‍රීවරයෙකුට සිසුන් කී දෙනෙකු සඳහා පොත් ලබාදීමට අවස්ථාව සලසා දෙන්නේ ද යන්න තීරණය කළ යුතු බවත් පවසන ලදී.

ගරු මන්ත්‍රී කේ. හැරිසෙන්ස් මැතිතුමා මෙම පොත් ලබාදීම සඳහා මන්ත්‍රීවරයා විසින් තම බල ප්‍රදේශයේ පොත් ලබා දීමට අවශ්‍ය අඩු ආදායම්ලාභී පාසල් සිසුන්ගේ නාම ලේඛනය ගරු මහා සභාවට ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දී ඉන් අනතුරුව අදාළ මන්ත්‍රීවරයාට කොපමණ ප්‍රතිපාදන ලබා දෙන්නේ ද යන්න තීරණය කළ යුතු බවත් , පොත් ලබා දීමේදී උසස් පෙළ සිසුන් / සාමාන්‍ය පෙළ සිසුන්/හයෙන් ඉහළ ශ්‍රේණිවල සිසුන් ලෙස හෝ වර්ගීකරණ පදනම මත පොත් ලයිස්තු ලබාගත යුතු බවත් ප්‍රකාශ කරන ලදී. ඒ අනුව මේ පොත් ලබාදීමට කොපමණ මුදල් ප්‍රමාණයක් වෙන් කරන්නේ ද යන්න නිශ්චිතව සඳහන් කරන ලෙසටත් පවසන ලදී.

ගරු මන්ත්‍රී එස්.ඒ.කේ.පී ගුණවර්ධන මැතිතුමා මන්ත්‍රීවරු ඉදිරිපත් කරන නම් ප්‍රමාණයන් අනුව ගැටලුවක් ඇතිවිය හැකි බවත්, මෙහිදී සමානාත්මතාවයකින් යුතුව හා යම් සීමාවකට යටත්ව මෙම පොත් ලබා දීම සිදුකළ යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා මෙම පොත් ලබාදීම සඳහා දරුවන් තෝරා ගැනීමේදී ග්‍රාම නිලධාරීවරයාගේ අඩු ආදායම්ලාභී නිර්දේශය මත ලබා දීම සිදු කරන බවත්, පොත් ලබා දුන්නේ ද යන්න නිශ්චය කර ගැනීම සඳහා අප ප්‍රාදේශීය සභාවේ සංවර්ධන නිලධාරී තුමිය හා ලේකම්තුමාගේ අධීක්ෂණය මේ සඳහා යොමුකරන බවත්, ගරු මන්ත්‍රීතුමන්ලා විසින් ලබාදෙන නාම ලේඛන සඳහා සිසුන්ගේ නම් ලබා ගැනීමේදී ලිපිනය,පාසල,ශ්‍රේණිය අනුව ලයිස්තුගත කිරීම සිදුකරන බවත් ප්‍රකාශ කරන ලදී. ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් අඩු ආදායම් ලාභී පවුල් වල පාසල් සිසුන් සඳහා පොත් ලබා දීමේ යෝජනාව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

**14. මෝටර් ග්‍රේඩරයක් සහ ගල් රෝලක් සේවයට ලබා ගැනීම**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ප්‍රාදේශීය සභාව සතු මාර්ග සකස් කිරීම සඳහා මෝටර් ග්‍රේඩරයක් සහ ගල් රෝලක් වෙනත් ආයතනයකින් සේවයට ලබා ගැනීමේ අවශ්‍යතාව ඇති වී තිබේ.එහිදි පැය 200 ක් සඳහා මෝටර් ග්‍රේඩරයක් ද පැය 100 ක් සඳහා ගල් රෝලක් ලබා ගැනීමට අවශය බවත්, එම නිසා එම යන්ත්‍ර 2 ලබා ගැනීම සුදුසු බවත් පවසන ලදි.

ගරු උප සභාපති එම්.සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා ගරු සභාපතිතුමා විසින් මහ සභාවට ඉදිරිපත් කරන ලද මෝටර් ග්‍රේඩරයක් සහ ගල් රෝලක් ලබා ගැනීම සඳහා වූ යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් මෝටර් ග්‍රේඩරයක් සහ ගල් රෝලක් සේවයට ලබා ගැනීමේ යෝජනාව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

**15. දිවා සුරකුම් සුරැකුම් මධ්‍යස්ථානයේ මාසික ගෙවීම සේවකයන්ගේ දරුවන් සඳහා සහන මිලකට ලබා දීම අනුමත කර ගැනීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා මෙම ඉල්ලීම අප ප්‍රාදේශීය සභාවේ බහුකාර්ය සේවිකාවක් ලෙස දිවා සුරකුම් මධ්‍යස්ථානයේ සේවය කරන සේවිකාවක් විසින් ඉල්ලා සිටින අතර,ඇයට මෙන්ම ප්‍රාදේශීය සභාවේ සේවය කරන නිලධාරීන්ගේ දරුවන්ට ද දිවා සුරකුම් මධ්‍යස්ථානය සහන මිලකට ලබා දීම සුදුසු බවට යෝජනා කරන ලදී. ඒ අනුව අය කිරීමට නියමිත මුදලින් සභා සේවකයින් ගේ දරුවන් සඳහා 1/2 ක මුදලක් ලබා දීම සුදුසු බවට පවසන ලදී

ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද දිවා සුරකුම් දිවා සුරකුම් සුරකුම් මධ්‍යස්ථානයේ මාසික ගෙවීම සේවකයන්ගේ දරුවන් සඳහා සහන මිලකට ලබා දීමේ යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් දිවා සුරකුම් සුරකුම් මධ්‍යස්ථානයේ මාසික ගෙවීම සේවකයන්ගේ දරුවන් සඳහා සහන මිලකට ලබා දීම අනුමත කර ගැනීමෙ යෝජනාව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

**16. ඉන්ධන තැන්පත් මුදල ලක්ෂ පහක් 5 ක් දක්වා වැඩි කර ගැනීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා කාර්යාලයේ වාහන සඳහා ලබාගන්නා ඉන්ධන වලට ජයවර්ධන ඉන්ධන පිරවුම් හල වෙත තැන්පත් කර ඇති රුපියල් ලක්ෂ 2 ක මුදල ඉන්ධන මිල ඉහළ යාම හේතුවෙන් රුපියල් ලක්ෂ 5ක් දක්වා වැඩි කිරීමට ඉන්ධන පිරවුම් ආයතනයෙන් මා වෙත වාචිකව දැනුම් දී ඇති බවත් ඒ අනුව ඉන්ධන තැන්පත් මුදල රුපියල් ලක්ෂ 5 ක් දක්වා වැඩි කර ගැනීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉන්ධන තැන්පත් මුදල ලක්ෂ 5 ක් දක්වා වැඩි කිරීමේ යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් ඉන්ධන තැන්පත් මුදල ලක්ෂ පහක් 5 ක් දක්වා වැඩි කර ගැනීමෙ යෝජනාව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

**17. ප්‍රදේශය දරුවන්ට ඉංග්‍රීසි ඇතුළු භාෂා ඉගැන්වීමට මධ්‍යස්ථානයක් ලබා ගැනීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතමා ඩබ්ලිව් එම්.එම්.එච්. විජේසිංහ යන අය විසින් මෙම ඉල්ලීම සිදු කර ඇති බවත්, ඔහු ශාස්ත්‍රවේදී ඉංග්‍රීසි උපාධිධාරී, ඉංග්‍රීසි ඩිප්ලෝමාධාරී පුහුණු ඉංග්‍රීසි ගුරු, සිංහල ඉංග්‍රීසි භාෂා පරිවර්තක, ප්‍රාචීන භාෂා සමත්, ජපන් භාෂා සහතිකපත්‍රලාභී, දහම් පාසල් ගුරුවරයකු වන බවත්, එතුමන් සඳහා ප්‍රදේශයේ දරුවන්ට ඉංග්‍රීසි ඇතුළු භාෂා ඉගැන්වීමට මධ්‍යස්ථානයක් ඉල්ලුම් කරන අතර එහිදී අලුතින්ම තැනක් සොයනු වෙනුවට ඔහුගේ නිවසට යාබද සංගමයක් විසින් පෞද්ගලික ධනය හා රජය රජයේ මුදල් වැය කර ඉදි කිරීම් ආරම්භ කර දැනට අතරමග නැවතී ඇති ගොඩනැගිල්ල සම්පූර්ණ කර මෙම අවශ්‍යතාවය සපුරා දරුවන්ගේ අනාගතයට යහපත් ආයෝජනයක් සිදු කර දෙන මෙන් ගෞරවයෙන් ඉල්ලා සිටින බව ප්‍රකාශ කරන ලදී. මෙම භූමිය අප ප්‍රාදේශීය සභා සතු වන බවත්, එම නිසා මෙම ප්‍රජා ශාලාව සකස් කර ලබා දීම සුදුසු බවත් පවසන ලදී.

ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා එම ප්‍රජා ශාලාව සකස් කර දීම සඳහා ඇස්තමේන්තුවක් මහා සභාවට ඉදිරිපත් කරන එය සකස් කර නීතියානුකූලව ලබාදීම සුදුසු බවත්, සභාපතිතුමා විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද යෝජනාව ස්ථිර කරන බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් ප්‍රදේශය දරුවන්ට ඉංග්‍රීසි ඇතුළු

භාෂා ඉගැන්වීමට මධ්‍යස්ථානයක් ලබා ගැනීමෙ යෝජනාව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

**18. 2023 වර්ෂය සඳහා ගිවිසුම් අලුත් කිරීම හා ඇප තැන්පත් මුදලක් ලබා ගැනීම සම්බන්ධව.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතමා අනුරාධපුර විවිධ සේවා සමූපකාර සමිතිය විසින් මෙම ලිපිය ඉදිරිපත් කර ඇති බවත් ඔවුන් රුපියල් පනස්දාහක ඇප තැන්පත් මුදලක් හා මාසික කුලිය රුපියල් හත්දහස් පන්සියයක් වන ලෙස තීරණය කර අප ප්‍රාදේශීය සභාවෙන් නිකුත් කර ඇති ලිපිය ඔවුන්ට ලැබුණු බවත්, එහිදී මෙම වෙළෙඳ සැලෙන් විශාල ලාභ අවස්ථාවක් ලබා නොගන්නා බවත්, ඒ අනුව මෙම අප තැන්පත් මුදල් හා කුලී මුදල අඩු කර දෙන ලෙසත් ඉල්ලා සිටින බව ප්‍රකාශ කරන ලදී. ඒ අනුව රාජ්‍ය ආයතනයක් වන නිසාත් මේ තුළින් ජනතාවට මෙහෙවරක් සිදු වන නිසාත් එම මුදල් අඩු කර දීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා මෙම ආයතනය රාජ්‍ය ආයතනයක් වන නිසාත් මෙහි ඇප තැන්පත් මුදල රුපියල් 25,000 ක් දක්වා අඩුකර කුලී මුදල රුපියල් පන්දහක් ලෙස ලබාදීම සුදුසු බවත්, ගරු සභාපතිතුමා විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද යෝජනාව ස්ථිර කරන බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් 2023 වර්ෂය සඳහා ගිවිසුම් අලුත් කිරීම හා ඇප තැන්පත් මුදලක් ලබා ගැනීම සම්බන්ධ යෝජනාව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

**19. 2021 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව සභාගත කිරීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතමා 2021.12.31 දිනෙන් අවසන් වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව පිළිබඳ ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදී. භාණ්ඩ සමීක්ෂණයෙන් හඳුනාගත් වෙන්දේසි කළ යුතු භාණ්ඩ , විනාශ කළ යුතු භාණ්ඩ , වෙන්දේසි කිරීම හා විනාශ කිරීමටත්, පොත් වලින් කපා හැරීමටත් අනුමත කිරීම සුදුසු බවට යොජනා කරමි.

ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා ගරු සභාපතිතුමා විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද 2021 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව සභාගත කිරීම සුදුසු බවට වූ යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් 2021 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව සභාගත කිරීම සම්බන්ධ යෝජනාව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය

**20. කසුන් මහතාගේ නිවසට යන පාර සම්බන්ධව.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතමා කුඩාපාලාඩිකුලම ගම්වැසියන් විසින් මෙම යෝජනාව ඉදිරිපත් කර ඇති බවත්, එහිදී දැනට අවුරුද්දක පමණ සිට මෙම පාරේ ගමන් කිරීම අපහසු බවත් එයට හේතුව ගල් අතුරා ඇති නිසා බවත්, එමනිසා මෙම පාර ගමන් කිරීමට හැකි අයුරින් සකසා දෙන ලෙස ඉදිරිපත් කර ඇති බවත්, ඒ අනුව මූලිකවම මේ සඳහා පවතින ගිවිසුම අවලංගු කළ යුතු බවත්, පසුව කාර්මික නිලධාරීන් යොදවා මෙය පරීක්ෂාකර බලා මාර්ග සකස් කර දීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී බී.බී.ඊ.ගයාන් චාමර මැතිතුමා කාර්මික නිලධාරීන් මේ සඳහා යොදවා ඇස්තමේන්තුවක් සකස් කර මාර්ග සකස් කරන ලබා දීම සුදුසු බවත්, සභාපතිතුමා විසින් කළ යෝජනාව ස්ථිර කරන බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් කසුන් මහතාගේ නිවසට යන පාර සම්බන්ධ යෝජනාව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය

**21. කටුගම්පල උපාලි චාමර මහතාගේ නිවස ඉදිරිපිට මාර්ගයේ බෝක්කුවක් ඉදි ඉදිකිරීම් නැමති ව්‍යාපෘතියට ගෙවීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා කටුගම්පල උපාලි චාමර මහතාගේ නිවස ඉදිරිපිට මාර්ගයේ බෝක්කුවක් ඉදි ඉදිකිරීම් නැමති ව්‍යාපෘතිය ඉදිරිපත් කරන ලද රුපියල් 259,273.74 ඇස්තමේන්තුව 2021.12.09 මුදල් කමිටු තීරණ අංක 16 යටතේ අනුමත වී 2021.12.21 වන දින මහා සභාවේ දී සම්මත වී ඇත.

එසේ වුවද එම ව්‍යාපෘතිය 2022 වර්ෂයේ ආරම්භ කර ඇති අතර මිල විචලතාවය මත එහි ඇස්තමේන්තුව රුපියල් 862, 251.90 ක් ලෙස සංශෝධනය වී ඇති අතර, මෙම ව්‍යාපෘතියේ වැඩ කටයුතු ද මේ වන විට අවසන් වී ඇති බවත් එම නිසා ගෙවීම් කටයුතු සිදු කිරීමට මෙම ඇස්තමේන්තුව අනුමත කිරීම් සඳහා මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

ගරු මන්ත්‍රී කේ.ඒ සංජීව මැතිතුමා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද කටුගම්පල උපාලි චාමර මහතාගේ නිවස ඉදිරිපිට මාර්ගයේ බෝක්කුවක් ඉදි ඉදිකිරීම් නැමති ව්‍යාපෘතියට ගෙවීමේ යෝජනා ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරුද්ධත්වයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් කටුගම්පල උපාලි චාමර මහතාගේ නිවස ඉදිරිපිට මාර්ගයේ බෝක්කුවක් ඉදි ඉදිකිරීම් නැමති ව්‍යාපෘතියට ගෙවීමේ යෝජනාව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

**22. බෝක්කුවක් ඉදිකරගැනීම සඳහා.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා කවරක්කුලම ප්‍රාදේශීය සභා මන්ත්‍රී සිරිවර්ධන මන්ත්‍රිතුමා විසින් මෙම යෝජනාව ඉදිරිපත් කර ඇති බවත්, එහිදී 275 කවරක්කුලම විභූති ගම හැරෙන මංසන්දිය ඉතාම අවදානම් සහගත බැවින් ජීවිත හානි සිදුවීමට ද ඉඩ ඇති බැවින් ප්‍රධාන මාර්ගයෙන් අතුරු මාර්ගයට හැරෙන තැන බෝක්කුව අවදානම් නිසා ඒ සඳහා අඩි 20ක පමණ බෝක්කුවක් යොදවා එය සකස් කර දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටින බවත් ප්‍රකාශ කරන ලදී. ඒ අනුව මේ සඳහා කාර්මික නිලධාරී තුමන් යොදවා පරීක්ෂාකර බලා සුදුසු වැඩපිළිවෙළක් යෙදීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද බෝක්කුවක් ඉදිකරගැනීමෙ යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරුද්ධත්වයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් බෝක්කුවක් ඉදිකරගැනීම සඳහා වූ යෝජනාව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

**23. සනීපාරක්ෂක උපකරණ ලබා ගැනීම සඳහා.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ගල්කුලම කවරක්කුලම කරුණාවතී යන අය විසින් මෙම ඉල්ලීම ඉදිරිපත් කර ඇති අතර ඇය රිය අනතුරකට ලක් වී ඇවිද ගැනීමට අපහසුවෙන් එක්තැන් වී සිටින බවත්, වැසිකිළියකට යාමේ අපහසුතාවය ද පවතින නිසා වැසිකිලියක් සකස් කරගැනීමට අවශ්‍ය උපකරණ ලබා දෙන මෙන් ඉල්ලා සිටින බවට ප්‍රකාශ කරන ලදී. ඒ අනුව මේ එම ඉල්ලීම සිදු කර දීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී පී.එස්.බී සිරිවර්ධන මැතිතුමා සභාපතිතුමා විසින් ගරු මහා සභාවට ඉදිරිපත් කරන වැසිකිළි උපකරණ ලබාදීම සඳහා වූ යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරුද්ධත්වයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් වැසිකිළි උපකරණ ලබා ගැනීම සඳහා වූ යෝජනාව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

**24. නෙලුබැව කිරිහල ලබා ගැනීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ශ්‍රාවස්තිපුර ආමනය දෙකේ ඇල පදිංචි ජීවක පුෂ්පකුමාර යන අය විසින් මෙම ඉල්ලීම සිදු කර ඇති අතර ඔහු විසින් කුඩා නෙළුබැව ග්‍රාමීය රෝහල ඉදිරිපිට ඇති කිරිහල තුළ වෙළෙඳ ව්‍යාපාරයක් ආරම්භකර පවත්වාගෙන යාමට අවස්ථාව ලබා දෙන ලෙසට ඉල්ලීම් කර ඇති බවත්, ඒ සඳහා එම කිරි හල ලබාදීම සුදුසු බවත් යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී කේ.ඒ සංජීව මැතිතුමා කුඩා නෙළුබැව ග්‍රාමීය රෝහල ඉදිරිපිට ඇති මෙම කිරිහල තුළ වෙළෙඳ ව්‍යාපාරයක් ආරම්භ කර පවත්වාගෙන යාම සඳහා සභාපතිතුමා විසින් ගෙනා යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරුද්ධත්වයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් වැසිකිළි නෙලුබැව කිරිහල ලබා ගැනීම සඳහා වූ යෝජනාව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

**ඊ) කාරක සභාවල වාර්තා**

- 2022 දෙසැම්බර් මස 08 වන දින මුදල් කමිටු වාර්ථාව සභා ගත කරන ලදී.

**එ) ලැබීම් ගෙවීම් මාසික වාර්තා**

- 2022 නොවැම්බර් මස ආදායම් හා වියදම් වාර්ථා මහ සභාවේ සලකා බැලීම සිදු කරන ලදී.

ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා ගෙවීම් වාර්ථා වල පරිපාලන වියදම්, සේවක වැටුප්, මන්ත්‍රී දීමනා හැර අනෙකුත් ගෙවීම් සඳහා තමන් විරුද්ධ බව ප්‍රකාශ කරන ලදි.

**ඒ) රැස්වීම් කැඳවීමේ දැන්වීම් හා වෙනත් කාරණා ඉදිරිපත් කිරීම.**

**01.නිවාඩු දැනුම් දීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ගරු මන්ත්‍රී එම්.ඒ විමලසුරේන්ද්‍ර මැතිතුමා මහ සභාවට නොපැමිණෙන බවට දන්වා යොමු කර තිබූ නිවාඩු ඉල්ලීම් මහ සභාවට ඉදිරිපත් කරන ලදී.

ගරු මන්ත්‍රී බී.බී.ඊ ගයාන් චාමර මැතිතුමා අදාල නිවාඩු ඉල්ලුම් කර ඇති ගරු සභිකතුමන් වෙත නිවාඩු ලබා දීම සුදුසු බව සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා මෙම කාලයේදී ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනතාවගේ සුබසිද්ධිය උදෙසා ප්‍රාදේශීය සභාවේ කාර්ය මණ්ඩලය විශාල කැප කිරීමක් කළ අතර ඒ සඳහා තමා ස්තුතිවන්ත වන බවත්, එමෙන්ම ගරු සභාපතිතුමා තුළ මන්ත්‍රී මණ්ඩලය ද ජනතාවගේ සුබසිද්ධිය උදෙසා බොහෝ කටයුතු සිදු කළ අතර ඒ සඳහා ද ගෞරවනීය ස්තුතිය පුද කරන බවත්, විශේෂයෙන්ම මාධ්‍ය තුළ ප්‍රචාරණය වන අනිත් සභාවන්ට සාපේක්ෂව අප ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරුන් අතර මත ගැටුම් ඇති නොවුණු බවත් ඒ සඳහා සියලුම ගරු මන්ත්‍රීවරුන් වෙත තමාගේ ගෞරවය පුද කරන බවත්, ප්‍රාදේශීය සභාවේ කාන්තා මන්ත්‍රී මණ්ඩලය නියෝජනය කරන කාන්තා මන්ත්‍රීවරියන් පස් දෙනා කාන්තාවන් ලෙස මන්ත්‍රී ධූරය හොබවමින් සමාජයේ විවිධ පීඩා මැද සිදු කළ සේවාව වෙනුවෙන් තමාගේ ගෞරවනීය ස්තුතිය පුද කරන බවත්, එමෙන්ම ළඟදී පැවැත්වීමට නියමිත මැතිවරණයේදී ගරු සභාපතිතුමා ඇතුළු සියලුම ගරු මන්ත්‍රීවරුන් වෙත ජයග්‍රහණය කිරීම උදෙසා තමා හෘදයාංගමව සුභ පැතුම් එක් කරන බවත්, 2023 නව වසරට

ද සියලු දෙනාට සිතුම් පැතුම් ඉටුවන සුභ නව වසරක් වේවා යනුවෙන් පවසා අදහස් දැක්වීම අවසන් කරන ලදී.

ගරු මන්ත්‍රී පී.ටී සිරිසේන මැතිතුමා මෙම මන්ත්‍රීධුර දරණ කාලයේදී ප්‍රාදේශීය සභාවක් ලෙස සියලු දෙනා හොඳින් සංවර්ධන කටයුතු සිදු කළ බවත්, පසුගිය කාලයේ රටේ පැවති විවිධ කරදර හමුවේද ප්‍රාදේශීය සභාවක් ලෙස එක්වී ඒ සඳහා නිසි ලෙස මුහුණ දුන් බවත්, ගරු කුමාරසිංහ මන්ත්‍රීතුමා සඳහන් කළ ආකාරයට මෙම කාලයේ මන්ත්‍රීවරුන් ගෞරවාන්විතව ක්‍රියා කළ බවත්, මෙම ධූර කාලයේදී තමා වෙත පවරන ලද වගකීම් නිසි ආකාරයෙන් ඉටු කළ අතර එහිදී ප්‍රධාන වශයෙන් සුනබ එන්නත් කරනය හා ශිෂ්‍යත්ව වැඩසටහන් ඉතා සාර්ථකව නිම කළ බවත්, වසංගත තත්වය යටතේ එන්නත් කරන වැඩසටහන ද ඉතා සාර්ථකව සිදුකළ බවත්, සම්මන්ත්‍රණ වැඩසටහන් සඳහා සහය ලබා දුන් ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයට හා ප්‍රාදේශීය සභාවේ කාර්ය මණ්ඩලයට තමාගේ ස්තුතිය පුද කරන බවත්, එමෙන්ම හිරු කිරණ පුවත්පත නොමිලේ ලබා දී දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් විශාල සේවාවක් ඉටු කළ ගරු සභාපතිතුමා න්ට තමාගේ ගෞරවනීය ස්තුතිය පුද කරන බවත්, ඉදිරියේදී සාමාන්‍ය පෙළ දරුවන් සඳහා ද සම්මන්ත්‍රණ මාලාවක් පැවැත්වීමට තමා අදහස් කරන බවත්, අනාගතයේ දී නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව තව තවත් ඉහලට ගෙන ඒමට සියලු දෙනා එකට එක් වී කටයුතු කරමු යැයි පවසා අදහස් දැක්වීම අවසන් කරන ලදී.

ගරු මන්ත්‍රී කේ. හැරිසෙන්ස් මැතිතුමා ප්‍රාදේශීය සභාව තුළින් සිදු සිදුකරන සංවර්ධන කටයුතු සඳහා ස්වේච්ඡා සංවිධානය තුළ නීති පද්ධතියක් පවතින බවත්, සමහර අවස්ථාවලදී දේශපාලන අධිකාරියේ බලපෑම මත නිලධාරීන් තිදෙනා ද එක්වී සමාජයට අසාධාරණයක් සිදුවන බවත්, සමහර අවස්ථාවලදී කොන්ත්‍රාත්කරු කොළඹ සිටින අතර ගමේ කටයුත්තක් ගමේ ගිවිසුම් ගත වී සිටින බවත්, මේ තුළින් ගැටළු ඇති වන බවත්, 239 කුඩාපාලාඩිකුලම තුලානේ අසාධු ලේඛණගත වීම පිළිබඳ නොව සංවර්ධනය කටයුත්ත පිළිබඳව කිසිදු දැනීමක් නොමැතිව සිදුකිරීම පිළිබඳව තමා ප්‍රකාශ කරන බවත්, මේ පිළිබඳව ප්‍රාදේශීය ලේකම් තුමන් සමග සාකච්ඡා කර නිසි ක්‍රමවේදයකට සිදු කිරීම සඳහා බලයක් ලබා ගත යුතු බවත්, මෙම අදහස් දැක්වීම මෙම ධූර කාලයේ අවසන් දිනය වන්නේ ද යයි නොදන්නා බවත්, ඉදිරියේදී ජනතාව විසින් නිවැරදි තීරණයක් ගෙන රටේ පාලනය සඳහා පාලකයින් පත් කරනු ලබයි යනුවෙන් පවසා අදහස් දැක්වීම අවසන් කරන ලදී.

ගරු මන්ත්‍රී එස්.ඒ.කේ.පී ගුණවර්ධන මැතිතුමා රට තුළ මෙම අවස්ථාවේදී මැතිවරණයක් තිබීම සුදුසු බවත්, නමුත් මැතිවරණය කල් යාමේ කතිකාවක් සමාජය තුළ පැතිරෙන බවත්, මේ සඳහා තම පක්ෂය එකඟ නොවන බවත් පවසන ලදී. රටේ පසුගිය අයවැය ඉදිරිපත් කළ අතර, ඒ තුළ කිසිදු සාධාරණීය තාවයක් නොමැති බවත්, ආබාධිතයින් වෙනුවෙන් ලබාදුන් මුදලින් රුපියල් දෙදහස් පන්සියයක් කපාහැර ඇති බවත්, මේ ආකාරයෙ සිදුවීම් තුළින් ජනතාව වෙනුවෙන් මෙම අයවැය ක්‍රියාත්මක නොවන බවත් පවසන ලදී. ඉදිරි වර්ෂය ජනතාවට ආර්ථික ලෙස අසීරු වර්ෂයක් බවත්,මෙම ප්‍රාදේශීය සභාව තුළ ද පාසල් දරුවන් සඳහා පොත් ලබා දීමේ යෝජනාවක් ඉදිරිපත් වූ අතර වර්තමානයේදි ජනතාව තුල පාසල් දරුවන්ට පොත් මිලදී ගැනීමට පවා දැඩි අසීරුතාවයක් පවතින බවත්, රටේ අය වැය තුළද ආදායම් උත්පාදනය කිරීමේ නිසි ක්‍රියාමාර්ග අන්තර්ගත වී නොමැති බවත්, විශේෂයෙන්ම විදේශ විනිමය ඉපයීමේ මාර්ග මෙහි සඳහන් වී නොමැති බවත්, එමෙන්ම රටේ පවතින සම්පත් විකිණීම වෙනුවෙන් විරුද්ධත්වය පළ කිරීම සිදු කළ යුතු බවත්, එළඹෙන 2023 වර්ෂය රටට මෙන්ම සියලු දෙනාටම සුබදායී වර්ෂයක් වේවායි ප්‍රාර්ථනා කරමින් අදහස් දැක්වීම අවසන් කරන ලදී.

ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා මෙම ධූර කාලය තුළදී තමා ක්‍රියා කළ ආකාරය සම්බන්ධයෙන් සතුටු වන බවත්, පසුගිය කාල වලදීද රටේ ප්‍රශ්න කෙතරම් තිබුණත් මැතිවරණ කල් දා නොමැති බවත්, ගරු කුමුදු මන්ත්‍රී තුමන් සඳහන් කළ ආකාරයට රටේ වටිනා සම්පත් විකුණන පක්ෂයකට ගැතිව කටයුතු කිරීම නුසුදුසු බවත්, තමා ඡන්දය ඉල්ලන්නේ නම් හොරකම් කර නොමැති පක්ෂයකින් ඡන්දය ඉල්ලන බවත්, යහපාලනය යන වචනය යොදා ගනිමින් සිදු කළ ක්‍රියාකලාපය නිසා එම වචනය ද අප්‍රිය තාවයකට පත් වී ඇති බවත්, වර්තමානය වන විට සියලු දේශපාලන පක්ෂ විනාශ වී ඇති බවත්, එම නිසා පක්ෂ භේදයකින් තොරව සියලු

දෙනා එකට එක් වී නූපන් පරපුරක් වෙනුවෙන් තීරණ ගත යුතු බවත්, හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා වෙඩි තියන්න එපා යනුවෙන් පවසා ඉවත් වී ගිය බවත් නමුත් විය යුත්තේ පාලකයෙකු ලෙස කෙලින් තීරණ ගැනීම බවත්, එම නිසා නිවැරදි තීරණ ගන්නා හොඳ, අවංක, දක්ශ පාලකයන් පත්කර ගැනීම සුදුසු බවත් හා මේ රට භේදයකින් තොර සියලු දෙනා එකට එක් වී ගොඩ ගැනීම සිදු කළ යුතු බව පවසමින් අදහස් දැක්වීම අවසන් කරන ලදී.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> සභාපති ලෙස කටයුතු කළ මෙම ධූර කාලය තුළදී ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනතාවගේ සුබසිද්ධිය උදෙසා තමා සිදු කළ සේවාව වෙනුවෙන් තමා තුල අවංක සතුටක් පවතින බවත්, අද කළ යුතු දේ අදම කරමින් කඩිනම් සේවා සැපයීම සිදු කළ බවත්, හැකියාව හා දක්ෂතාවය මත සිදුකරන කාර්යයන් පිළිබඳව තම තමන් දරාගත යුතු බවත්, ජනතා නියෝජිතයින් ලෙස තේරී පත්වන්නේ ජනතාවගේ සුබසිද්ධිය උදෙසා ජනතාව වෙනුවෙන් කටයුතු කළ පුද්ගලයින් බවත්, තමාට කළ හැකි උපරිමයෙන් ක්‍රියාකිරීම තුළින් ගමන් කළ හැකි උපරිම දුර යා හැකි බවත්, ඒ අනුව අනාගතයේදී රට තුළද යහපත් තත්ත්වයක් උදා වේ යැයි පවසන ලදී. පවසා ප්‍රදේශයේ ජනතාවගේ සුභ සිද්ධිය උදෙසා තීන්දු තීරණ ගැනීම වෙනුවෙන් ගෞරවයෙන් සහයෝගය දැක්වූ ගරු මන්ත්‍රීතුමන්ලා වෙත හා ගරු මන්ත්‍රීතුමියන්ලා වෙත ස්තූතිය ප්‍රකාශ කරමින් 2022.12.16 වන දින පැවැත්වූ මහ සභා රැස්වීම ප.ව 01.55 ට අවසන් කරන ලද අතර එළබෙන මහ සභාව 2023.01.17 වන දින පෙ.ව 10.00 පැවැත්වෙන බව සඳහන් කරන ලදී.එමෙන්ම 2023 වර්ෂය සඳහා ජයග්‍රාහී සුබවාදී වර්ෂයක් වේවායැයි ප්‍රාර්ථනා කරමින් අදහස් දැක්වීම අවසන් කරන ලදී.

| | |
|---|---|
| ..................................... | .......................................... |
| ලේකම්, | සභාපති , |
| නැ. නු. ප ප්‍රාදේශීය සභාව, | නැ. නු. ප්‍රාදේශීය සභාව, |
| විජයපුර. | විජයපුර. |